කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

පෙරදිග සංගීතය - I

6 ශ්‍රේණිය

කාලය පැය 1 1/2 යි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) වඩාත් සුදුසු පිළිතුරට යටින් ඉරක් ගසන්න.

1. සප්තකයේ පළමු ස්වරය වනුයේ
   - i. ෂඩ්ජය
   - ii. ගාන්ධාරය
   - iii. මධ්‍යමය
   - iv. පංචමය

2. පංචමයට ඉහළින් පවතින ස්වරයකි
   - i. ග
   - ii. ම
   - iii. නි
   - iv. රි

3. ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘ
   - i. පණ්ඩිත් අමරදේව සූරීන්
   - ii. ආනන්ද සමරකෝන් සූරීන්
   - iii. සුනිල් ශාන්ත සූරීන්
   - iv. මහගම සේකර සූරීන්

4. ස රි ග ම , රි ග ම ප , ග ම ප ධ , යන රටාවෙහි මීලග ස්වර බණ්ඩය වන්නේ,
   - i. රි ග රි ස
   - ii. ස නි ධ ප
   - iii. ම ප ධ නි
   - iv. ග රි ම ග

5. ස ස ග ග / රි රි ග - / ස ස රි රි / ග - - - / මෙහි ගී පාදය වනුයේ
   - i. ඉහලට නැගයති පහලට බැසවිති
   - ii. කඳුපෙල අතරේ තුරු වදුලේ
   - iii. ගී නාදේ ගැමියා මවනා
   - iv. එකට සතුටු සාගරේ

6. පෙරදිග සංගීතයේ ග ස්වරයට හිමි බටහිර සංගීත ස්වරය,
   - i. C
   - ii. D
   - iii. F
   - iv. E

7. බටහිර සංගීතයේදී ගායනාවන Do , Re , Mee , Fa ට සමාන පෙරදිග ස්වර
   - i. ම ග රි ස
   - ii. ප ධ නි ස
   - iii. ස රි ග ම
   - iv. ස නි ධ ප

8. ගායනය පුහුණුවීමට සහායවන සංගීත භාණ්ඩයකි

i. මැන්ඩලීනය
ii. සිතාරය
iii. මවුත් ඕගනය
iv. සර්පිනාව

9. පංචතූර්ය නාදයට අයත් නොවන්නකි

i. ගැටබෙරය
ii. දවුල
iii. සිතාරය
iv. තම්මැට්ටම

10. ගී පාදයක් ප්‍රස්ථාර කිරීමේදී ඇදීම දක්වන සංඛේතය වනුයේ

i. X
ii. S
iii. –...
iv. //

02) හිස්තැන් පුරවන්න.

1. පෙරමුණ ගැනුමෙහි දිරිවඩමු ......... ගී පාදය අයත්වන්නේ .................................... යි
2. සප්තකයට ස්වර ........................................ අයත්වේ.
3. ........................................ ගීතය ළමා ගීයකි.
4. ගීතයක් ගැයීමේදී අත්පුඩිය වෙනුවට වාදනය කලහැකි ආදේශ භාණ්ඩයක් වනුයේ ................................ ය.
5. නලාවක් ලෙසින් හඬ නිපදවියහැකි ආදේශ භාණ්ඩයකි.

- නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| 6. සංගීතයේ මාධ්‍ය යනුයේ | උඩරට බෙරය |
| 7. නර්තනයට යොදාගන්නා භාණ්ඩයකි | ලක්නව් |
| 8. ආදේශ භාණ්ඩයකි | දකුණු ඉන්දියාව |
| 9. කර්ණාඨ සංගීතය පවතින ප්‍රදේශයකි | නාදයයි |
| 10. පෙරදිග සංගීතය ප්‍රචලිත ප්‍රදේශයකි | ටොනික්මුඩි වලල්ල |

03) ඔබ උගත් ශුද්ධස්වර ස්ථාපන ගීයක් ගීත ස්වර ප්‍රස්ථාර කරන්න.

04) වයලීනය, බටනලාව, සර්පිනාව, සිතාරය, යන වැයින් භාණ්ඩ 2 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

05)

- ඔබ කැමති මාතෘකාවකින් කොටස් දෙකකින් යුක්ත ගීතයක් නිර්මාණය කරන්න.
- ඔබ කැමති සංගීත භාණ්ඩයක රූපසටහනක් අඳින්න.